**ගලේවෙල ප්‍රාදේශීය සභාව - 2020**
**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

ගලේවෙල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගනන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

----------------------------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පරිගණක පාඨමාලා සඳහා ලැබිය යුතු සම්පූර්ණ මුදල රු.724,500 ක් වුවද වර්ෂයේ මුදලින් ලද රු.455,300 ක් පමණක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | රටේ පැවති වසංගත තත්වය මත මධ්‍යස්ථානය වසා දැමීමට සිදුවීම නිසා පාඨමාලා ගාස්තු ගෙවීම අඩපණ වීම නිසා මෙම හිඟය ඇති වීඇති බව | ගනුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| (ආ) | ඉදිරිපත් කර ඇති උපලේඛන අනුව පරිභෝජන ද්‍රව්‍යවල 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.37,259 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.61,309 ක් ලෙස තොගය රු.24,050 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පෙන්වාදී ඇති අඩුපාඩුව පිළිගන්නා අතර, 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේදි එය නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | තැන්පතු ලේඛනයේ ඉදිරියට ගෙනා එකතු වටිනාකම රු.136,765 ක් වූ තැන්පතු ගිණුම් ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ තැන්පතු යටතේ දක්වා නොතිබුණි. | පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගන්නා අතර, 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේදී එය නිවැරදි කර ගන්නා බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ සභාවේ ගොඩනැගිලි සංවර්ධන කටයුතු සඳහා අවස්ථා 03 කදී දරන ලද එකතුව රු.572,568 ක් ප්‍රාග්ධනිත කරනොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේදි නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සභාව සතු සුසාන භූමි 82 කට අයත් අක්කර 116 රූඩ් 03 යි පර්චස් 17 ක ඉඩම් ප්‍රමාණය සභාවට පවරාගෙන තක්සේරු කර අදාළ වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කමිටුවක් මඟින් සිදුකරන බව | වත්කම් හඳුනාගෙන තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු හිඟ දැක්වීම් පුවරු ගාස්තු ගණනය කර ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පැවති වසංගත තත්වය මත නොහැකි වූ අතර, 2021 වර්ෂයේ අදාළ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීමටත්, ගාස්තු නොගෙවන්නන් සඳහා දැන්වීම් පුවරු කපා ඉවත් කිරීමට කටයුතු කරමි. | හිඟ ශේෂයන් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම. |
| (උ) | විගණනයට ඉදිරිපත් වූ වාහන ලැයිස්තුවේ දක්වා ඇති එහෙත් මූල්‍ය ප්‍රකාශනයේ මෝටර් රථ හා කරත්ත උපලේඛනයේ ඇතුළත් නොවූ එකතු වටිනාකම රු.46,302,939 ක් වූ වාහන 03 ක් විය. | 2021ගිණුම් සෑදීමේදී මෙය මෝටර් රථ හා කරත්ත උප ලේඛනයට ගෙන නිවැරදි කරන බව | වත්කම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම. |
| (ඌ) | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේ දක්වා ඇති එකතු වටිනාකම රු.104,000 ක් වූ ඉඩම් 05 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා නොතිබුණි. | ගිණුම් සකස් කිරීමේදී එම වටිනාකම් ගිණුම් ගත කර නොමැති බැවින් ඉදිරි වර්ෂයේ ගිණුම් ගත කරන බව | වත්කම් නිවැරදිව හඳුනාගෙන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම. |
| (එ) | සභාව සතුව පවතින බවට තහවුරු නොකළ එකතු වටිනාකම රු.758,300 ක් වූ වාහන ශේෂ 04 ක් මෝටර රථ හා කරත්ත උපලේඛනයේ ඇතුළත් කර තිබුණි. | කරුණු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව | සභාව සතු වාහන හඳුනාගෙන තහවුරු කරගත යුතුවීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

-----------------------------------------

| විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.69,368,001 ක් හා උපලේඛන/ වාර්තා අනුව වටිනාකම රු.52,589,252 ක් වූයෙන් රු.16,778,749 ක වෙනසක් විය. | ඉන්වෙන්ට්‍රි ලේඛනයේ තව දුරටත් පවතින දීර්ඝ කාලයක සිට නිරවුල් නොවී ඇති ගැටළු නිරාකරණය කිරීමට කමිටුවක් පත් කොට මේ වන විට ක්‍රියා කරන බව | වෙනස ගලපා මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වටිනාකම රු.68,115,631 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළව උපලේඛන ගෙවීම් හා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙහි සඳහන් පුස්තකාල පොත්, කාර්යාල උපකරණ, දොරකැට්වල කසළ අංගනයේ මහළ ඉදිකිරීමේ වියදම් ය. 2021 ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කර ගන්නා බව | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | පනත් | | | |
| I. | 1988 දෙසැම්බර් 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත | වෙළඳ බලපත්‍ර හිමි ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු වුවත් ව්‍යාපාර 254 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර තිබේද යන්න පරීක්ෂා කිරීමකින් තොරව වෙළඳ බලපත්‍ර 254 ක් නිකුත් කර තිබුණි. | සභාව විසින් ලබා දිය යුතු පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කරන බව | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| II. | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| | 177 රීතිය | රු.5,000 ට වැඩි සියළුම සැපයුම් සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී මිල කැඳවීමකින් තොරව අවස්ථා 02 කදී රු. 331,394 කට පීරිසි කෝප්ප වැලි හා මැටල් මිලදී ගෙන තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගන්නා අතර මින් ඉදිරියට විධිමත් මිලදී ගැනීම් ක්‍රමවේදය ඔස්සේ මිල කැඳවීම් කර කටයුතු කරන බව | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------- | | | |
| I. | මුදල් රෙගුලාසි 104 | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට හා කම්පැක්ටර් රථයට සිදුව තිබූ අලාභය සහා අනුමැතිය මත රු.91,608 කට අළුත්වැඩියා කර තිබුණි. රක්ෂණ වන්දි ලබාගැනිමට කටයුතු කර නොතිබූ අතර පරික්ෂණයක් සිදුකර වගකීම් නිශ්චය කරද නොතිබුණි. | පත්කළ පරීක්ෂණෂ මණ්ඩලය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් හේතුවෙන් නැවත පරීක්ෂණ මණ්ඩලය නම්කර දෙන මෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉල්ලීමක් කර ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2016 අගොස්තු 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිල ඇඳුම් දීමනාව ලබාගැනිමට හිමිකමක් නොමැති නිළයන්වලට අයත් නිලධාරීන් 04 දෙනෙකු සඳහා. 16,000 ක නිළ ඇඳුම් දීමනාව ලබාදී තිබුණි. | සිටින සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන හෙයින් මෙම සේවකයින් මහා සභා අනුමැතිය මත මෙම රාජකාරිවල අනුයුක්ත කර ඇති අතර, එම තනතුරුවලට අදාළ කර්තවයයන් ඉටුකිරීම හා නිසි පිළිවෙලට තම රාජකාරි කටයුතුවල නියලීමට මෙම නිල ඇඳුම් ලබාදී ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,454,775 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමරු.15,025,348 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම්<br>-------------<br>සමාලෝචිත වර්ෂයේ බිල් කළ වරිපනම් හා බදු ප්‍රමාණය රු.1,917,413 ක් වූ අතර ආරම්භක හිඟ හිටි වරිපනම් බදු ප්‍රමාණය රු.1,435,691 ක් විය. ඒ අනුව එකතුව වූ රු.3,353,104 ක මුදලින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණේ රු.1,748,000 ක් හෙවත් සියයට 52 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.1,548,718 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසංගත තත්වය නිසා ආයතන වසා තැබීම හේතුවෙන් රැස් කිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වූ බව | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය අනුව ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට පැවත එන හඳුනාගත නොහැකි ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කර්මාන්ත තැන්පත් රු.3,406,241 ක් පොදු තැන්පත් රු.10,892,664 ක් හා ටෙන්ඩර් තැන්පත් රු.398,554 ක් ලෙසට එකතු වටිනාකම රු.14,697,459 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කලක සිට පැවත එන හදුනා ගත නොහැකි ශේෂ නිරවුල් කිරීම සඳහා වෙනම කමිටුවක් පත්කර එම ගැටළු මේ වන විට අධ්‍යනය කරමින් පවතින බව | ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිවාස පියස වැඩ සටහන සඳහා මිලදී ගෙන තිබුණු රු.6,283,998 ක ගොඩනැගිලි ද්‍රව්‍යවලද, මාතෘධාරක වැඩසටහන යටතේ ළදරුවන්ගේ අවශ්‍යතා සඳහා රු.1,973,047 ක් වැයකර මිලදී ගෙන තිබුණ ද්‍රව්‍යවලද ප්‍රමාණයන් මිළකැඳවුමේ සඳහන් කර නොතිබුණි. | මිළ කැඳවීමේ සඳහන් කර නොතිබූ බව | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 මාර්ගෝපදේශය නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කසළ අංගනයේ ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය වර්ගීකරණය කර ගබඩා කර තිබුණත් 2020 අගෝස්තු 24 දිනැති අංක 4/1/2020 දරන ප.පා.කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා එම ගබඩාවල ධාරිතාව ඉක්මවා යාම නිසා අංගනයේ තැනින් තැන යකඩ හා ඇලුමිනියම් මිශ්‍රිත අපද්‍රව්‍ය ගොඩගසා තිබුණි. | ඉදිරියේදී එම ද්‍රව්‍ය අදාළ ආයතන වලට අළෙවි කිරීමට සැළසුම් කර ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) මෙම කසළ අංගනයේ දිරන කසළ එක් රැස් කර කොම්පෝස්ට් පොහොර නිපදවිය හැකි ලෙස ඉදිකොට තිබූ ගොඩනැගිලි දෙකක් තිබියදී රැස්වන දිරන කසළ සෑම බදාදා දිනකම දඹුල්ල කවෂිමා කසළ අංගනයට රැගෙන ගොස් භාරදෙනු ලබන අතර ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා කසළ ටොන් එකකට රු.1,000 ක් බැගින් ගෙවා තිබුණි. 2020 වර්ෂයේ කසළ ටොන් 48 ක් එසේ භාරදී ඒ සඳහා රු.48,000 ක් ගෙවීම් කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය අසාර්ථක වූ නිසා දිරන අපද්‍රව්‍ය කවශිමා ව්‍යාපෘතිය වෙත යොමුකරන බව | අසාර්ථක ව්‍යාපෘතිය ඵලදායී ව්‍යාපෘතියක් බවට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී නියමිත නිර්ණායකයන් සපුරා නොමැතිව පාරිසරික බලපත්‍ර නිකුත් නොකළ ඌරු ගොවිපළවල් 31 ක් සඳහා වෙළඳසැල් බලපත්‍ර නිකුත් කර තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය හා මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය, පශු වෛද්‍ය කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගලේවෙල පොලිස් ස්ථානය හා එක් ව මේ සඳහා ගුණාත්මක වැඩ පිළිවෙළක් සඳහා ඉදිරියේ දී යෙදවීමට කටයුතු කරන බව | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |